# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2387/35 - 2024 ජුනි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2024 ජුනි මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2024 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන **අතිවිශෙෂ ගැසට් පත්‍රයේ** ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ, 2024 මැයි මස 22 දිනැති අංක 24/0983/631/019-I දරන සංදේශය සඳහා 2024 මැයි මස 22 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

4. ඉහත සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල අංක 9 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ 2023 මාර්තු 22 දිනැති අංක 23/0585/631/008-I දරන අමාත්‍ය මණ්ඩල සටහන මත 2023 මාර්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය මගින් අනුමත කරන ලද පරිදි, "ක්‍රියාපටිපාටියඃ ප්‍රතිඅපනයන අරමුණු සඳහා පුවක් සැකසුම් කර්මාන්තය" අනුව ප්‍රකාශිත අනුමත ව්‍යවසායයක් විසින්, දේශීය වෙළෙඳපොළ තුළ වෙනත්


1A - PG 6717 — 404 (2024/06)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කිසිදු ආකාරයක ඍජු හෝ වක්‍ර විකුණුම් අරමුණු සඳහා නොවන, සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයේ ඉලක්කම් හතරක (04) මට්ටමේ පරිවර්තනය සමග දේශීයව එකතු කළ අගය අවම වශයෙන් 35% ක් සහිතව සහ එම ක්‍රියා පටිපාටියේ අනෙකුත් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, සැකසීම සහ ප්‍රති-අපනයනය කිරීමේ අරමුණ සඳහා, එම රෙගුලාසිවල **V උපලේඛනයේ** ලැයිස්තුගත කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0802.80.90 - වෙනත් (වියළි, පොතු ගැලවූ සහ තාප පිරියම් කරන ලද) යටතේ වර්ග කර ඇති පුවක් ආනයනය සඳහා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ආනයන පාලන බලපත්‍ර නිකුත් කළ යුතුය.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

6. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 06 - 0116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.